00769

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව

උපාධි වැඩසටහන- 5වන මට්ටම

අවසාන පරීක්ෂණය 2023/2024

EPU5256- ප්‍රාථමික අධ්‍යාපනය සඳහා ළමා අයිතිවාසිකම්

කාලය - පැය දෙකයි. (02)

දිනය - 2025.06.14 වේලාව - ප.ව.01.30 - ප.ව.03.30 දක්වා

---

I වන කොටසේ ඇති සියලුම ප්‍රශ්නවලට සහ II වන කොටසේ ඇති ඕනෑම ප්‍රශ්න තුනකට (03) පිළිතුරු සපයන්න.

## I - වන කොටස

01. ළමා අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් සම්මුතියේ දක්වා ඇති අයිතිවාසිකම් කාණ්ඩ කෙටියෙන් දක්වන්න.

02. එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් සම්මුතිය ක්‍රියාත්මක කිරීමට යාමේදී ශ්‍රී ලංකා රජය මුහුණ දෙන අභියෝග තුනක් (03) පැහැදිලි කරන්න.

03. ශ්‍රී ලංකාවේ ළමා අයිතිවාසිකම් සම්බන්ධව ලන්දේසීන් විසින් ඔවුන්ගේ පාලන සමයේ දී ගනු ලැබූ ප්‍රධාන ක්‍රියාමාර්ග තුනක් (03) කෙටියෙන් පැහැදිලි කරන්න.

04. "වර්තමානයේ ලිංගික අපයෝජන බහුල ලෙස සිදුවන බව මාධ්‍ය අනාවරණය කරයි." ලිංගික අපයෝජනයෙන් ප්‍රාථමික පාසල් දරුවන් ආරක්ෂා කර ගැනීම සඳහා ගුරුවරුන්ට යොදා ගත හැකි ක්‍රියාමාර්ග පහක් (05) ලියන්න.

05. ප්‍රාථමික පාසල් සිසුන්ගේ වර්ධනය සහ සංවර්ධනය පිළිබඳ අයිතිය ආරක්ෂා කිරීමට හා වැඩිදියුණු කිරීමට ශ්‍රී ලංකා රජයට ගත හැකි පියවර පහක් (05) ලැයිස්තු ගත කරන්න.

06. අන්තර්ජාලය හරහා සිදුවන හිංසනයෙන් ප්‍රාථමික පාසල් සිසුන් ආරක්ෂා කර ගැනීමට දෙමාපියන්ට ගත හැකි ක්‍රියාමාර්ග පහක් (05) යෝජනා කරන්න.

07. ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීමෙන් අත්වන වාසි පහක් (05) ලැයිස්තුගත කරන්න.

08. ප්‍රාථමික පාසල් සිසුන්ගේ ළමා අයිතිවාසිකම් සහතික කිරීමට ප්‍රාථමික පාසල් ගුරුවරයාට පන්ති කාමරය තුළ දී ගත හැකි ක්‍රියාමාර්ග පහක් (05) ලියන්න.

ලකුණු 05 X 08 =40

## 02 - වන කොටස

09. I. "ජීවත්වීමේ අයිතිය" යනු කුමක්ද? (ලකුණු 03)

II. ප්‍රාථමික පාසල් සිසුන්ගේ අධ්‍යාපනයට සහ සමස්ත සංවර්ධනයට ජීවත් වීමේ අයිතිය බලපාන්නේ කෙසේද? නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 07)



67

III. ප්‍රාථමික පාසල් වියේ පසුවන තම දරුවන්ගේ ජීවත්වීමේ අයිතිය සහතික කිරීමට දෙමාපියන්ට ගත හැකි ක්‍රියාමාර්ග තුනක් (03) සුදුසු උදාහරණ සමඟ විස්තර කරන්න. (ලකුණු 10 )

10. ප්‍රාථමික පාසල් සිසුන් රූපවාහිනියට හා පරිගනක ක්‍රීඩා සඳහා ඇබ්බැහිවීම ශ්‍රී ලංකාව ඇතුළු බොහෝ රටවලට උග්‍ර ගැටලුවක් බවට පත්ව ඇත."

I. ප්‍රාථමික පාසල් සිසුන් රූපවාහිනියට මෙන්ම පරිගනක ක්‍රීඩා වලට ඇබ්බැහිවීමට හේතු තුනක් (03) දක්වන්න. (ලකුණු 03 )

II. එම සිසුන් රූපවාහිනිය හා පරිගනක ක්‍රීඩා වලට ඇබ්බැහිවීම වළක්වා ගැනීමට ප්‍රාථමික පාසල් ගුරුවරයෙකු ලෙස ඔබට ගත හැකි ක්‍රියාමාර්ග තුනක් (03) විස්තර කරන්න. (ලකුණු 07 )

III. ඉහත සඳහන් ක්‍රියාමාර්ග භාවිත කිරීමේදි ප්‍රාථමික පාසල් ගුරුවරයා මුහුණ දෙන ගැටලු දෙකක් (02) හඳුනාගෙන එම ගැටලු අවම කිරීමට සුදුසු යෝජනා ඉදිරිපත් කරන්න. (ලකුණු 10 )

11. I. විශේෂ අවශ්‍යතා සහිත ළමයින්ගේ අයිතිවාසිකම් පාසල තුළ ක්‍රියාත්මක කිරීමේදී ඔවුන් මුහුණ දෙන අභියෝග තුනක් (03) ලියන්න. (ලකුණු 03 )

II. විශේෂ අවශ්‍යතා සහිත ළමයින්ගේ ජීවිතවල ගුණාත්මකභාවය වැඩිදියුණු කර ගැනීමට පාසලට දියහැකි සහයෝගය කුමක්ද? නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 07 )

III. ඉහත සඳහන් සහයෝගයන් ලබා දිමේදී පාසල මුහුණ දෙන ගැටලු පහක් (05) පැහැදිලි කරන්න. (ලකුණු 10 )

12. "පාසල තුළදී විශේෂ අවශ්‍යතා සහිත ප්‍රාථමික පාසල් සිසුන්ගේ සහභාගිත්ව අයිතිය සුරැකීම සඳහා ප්‍රාථමික ගුරුවරයා සතු කාර්යභාරය අසීමිතය."

I. සහභාගීත්ව අයිතිය ලෙස ඔබ අදහස් කරන්නේ කුමක්ද? (ලකුණු 03 )

II. පාසල තුළදී විශේෂ අවශ්‍යතා සහිත ළමයින්ගේ සහභාගීත්ව අයිතිය සුරැකීමට ප්‍රාථමික ගුරුවරයාට ගත හැකි පියවර පහක් (05) දක්වන්න. (ලකුණු 07)

III. එවැනි අවස්ථාවකදී ගුරුවරයා මුහුණ දෙන ගැටලු තුනක් (03) හා ඒවා අවම කිරීමට සුදුසු ක්‍රියාමාර්ග යෝජනා කරන්න. (ලකුණු 10 )

13. I. ළමා අයිතිවාසිකම් පිළිබඳ සමාජයේ දැනුවත්භාවය ඉහළ නැංවීමේදී දෘශ්‍ය මාධ්‍යයේ දක්නට ලැබෙන දුර්වලතා හතරක් (04) ලියන්න. (ලකුණු 04 )

II. ඔබ සඳහන් කළ එක් එක් දුර්වලතා ඇති වීමට බලපාන හේතු (අවම 2ක්) පරීක්ෂා කරන්න. (ලකුණු 08 )

III. පළමුවන ප්‍රශ්නයෙහි සඳහන් ළමා අයිතිවාසිකම් සම්බන්ධයෙන් දෘශ්‍ය මාධ්‍යයේ දක්නට ලැබෙන දුර්වලතා මඟ හරවා ගැනීමට යෝජනා දෙක (02) බැගින් සාකච්ඡා කරන්න. (ලකුණු 08 )

*-සියලුම හිමිකම් ඇවිරිණි.-*



බ